# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2006/51 - 2017 පෙබරවාරි මස 17 වැනි සිකුරාදා - 2017.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

DIK/LAN/02/30/42.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (I) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්මලේ ග්‍රාම නිලධාරි වසමේ බඹරැන්ද මධ්‍යම ගමේ පිහිටි මාතර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක මූ.පි. මාර 2700 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස්:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: වැලිපනේවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහිත මිශ්‍ර බෝග වගාවක් සහ සොහොනක් ඇත; හිමිකම් කියන අය: රත්මලේ, ගේගාවවත්ත හි පදිංචි මලවි ආරච්චිගේ විජේසේකර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0288.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: සෙංකුන්ඩගෙකැල්ල; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහිත මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: රත්මලේ, සෙංකුන්ඩගෙකැල්ල හි පදිංචි නම්බුහේවා තිලකසිරි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0240.

ඉහත සඳහන් ඉඩම/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017.03.20 වැනි දින පෙ.ව 10.30ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2017.03.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම්/ පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

බී. එස්. රන්ජිත,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2017 පෙබරවාරි මස 13 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
දික්වැල්ල.

03 - 199


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A - G 025155 – 19 - (2017/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.